Asia
Floor
Wage
Alliance

@asia_floorwage
@asia_floorwage
Asia Floor Wage Alliance
contact@asia.floorwage.org

# නව වාර්තාව: කොවිඩ් පැතිරීම ගැන අනතුරු ඇඟවීම් සිදු කළ වෘත්තීය සමිති, ශ්‍රී ලංකා රජය සහ ඇඟලුම් නිෂ්පාදක බ්‍රැන්ඩික්ස් විසින් ඉලක්ක කරගැනීම.

**කොළඹ, ශ්‍රී ලංකාව (අප්‍රේල් 11, 2022) –** Global Labour Justice-International Labour Rights Forum (GLJ-ILRF) සහ Asia Floor Wage Alliance (AFWA) විසින් අද නිකුත් කරන ලද නව වාර්තාවක්, ශ්‍රී ලංකාවේ විශාලතම ඇඟලුම් නිෂ්පාදකයා වන බ්‍රැන්ඩික්ස් ලංකා සහ ශ්‍රී ලංකා රජය, කොළඹින් පිටත පිහිටි නිදහස් වෙළඳ කලාපයක කොවිඩ් -19 ව්‍යාප්ත කිරීම පිළිබඳව වෘත්තීය සමිති හෙළිදරව් කිරීමත් සමග එම වෘත්තීය සමිති මර්දනය කළ ආකාරය විස්තර කරයි.

2020 ඔක්තෝම්බර් මාසයේදී, ඇඟලුම් සේවිකාවන් සහ අවට ප්‍රජාවන්හි පුද්ගලයින් දහස් ගණනක් ආසාදනය වූ අතර, කොවිඩ් -19 ප්‍රොටෝකෝල පැහැදිලිවම උල්ලංඝනය කරමින්, බ්‍රැන්ඩික්ස් කළමනාකාරිත්වය විසින් පවත්වන ලද ප්‍රසංගයකින් පසුව මෙය සිදු විය.

වෘත්තීය සමිති, කම්කරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ සංවිධාන සහ ඇඟලුම් සේවකයින් සමඟ පැවති සම්මුඛ සාකච්ඡා මත පදනම්ව, <u>**"Voices from the Field: Reprisals and Repression of Garment Worker Unions and Workers Organizations During COVID-19 in Sri Lanka" – "බිම් මට්ටමේ හඬ : ශ්‍රී ලංකාවේ කොවිඩ් -19 ව්‍යාප්තිය අතරතුර ඇඟලුම් සේවක සංගම් සහ කම්කරු සංවිධාන හට මුහුණ දීමට සිදුවූ පලිගැනීම් සහ මර්දනකාරී පිළිවෙත්,"**</u> වාර්තාව පෙන්නුම් කරන්නේ කම්හලේ කම්කරුවන් 1,400 න් 1,000 කට ආසාදනය වූ කොවිඩ් ව්‍යාප්තිය පැතිරීමට දින කිහිපයකට පෙර බ්‍රැන්ඩික්ස් සමාගම, රජයේ කොවිඩ් -19 මාර්ගෝපදේශ උල්ලංඝනය කළ බවයි. මෙම ව්‍යාප්තිය - රටේ විශාලතම එකකි - ඒ හේතුවෙන් කලාපයේ තවත් දහස් ගණනක් රෝගාතුර වුනු අතර, විශේෂයෙන් ඇඟලුම් සේවකයින් හට මෙම ව්‍යාප්තිය හේතුවෙන් දොස් පැවරිය.

බොහෝ දුරට කාන්තාවන් වන ඇඟලුම් සේවිකාවන් - සහ ඔවුන්ට සහාය දක්වන කාන්තා නායකත්වයෙන් යුත් වෘත්තීය සමිති සහ කම්කරු අයිතීන් සුරැකීමේ සංවිධාන, ව්‍යාප්තිය සඳහා බ්‍රැන්ඩික්ස් හි වගකීම ගැන ප්‍රසිද්ධියේ කතා කළ විට, බ්‍රැන්ඩික්ස් සමාගම සහ ශ්‍රී ලංකා රජය, පොලිසිය සහ හමුදාව එක්ව ඔවුන්ට එරෙහිව මර්දනකාරී වැඩපිළිවෙලක් දියත් කළේය.

"මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති මැඩපැවැත්වීම පිලිබඳ - රජය විසින් ඔවුන් නිදහස් වෙළඳ කලාපවලින් ඇත් කර තබන ආකාරය සහ ඇඟලුම් කම්කරුවන් වෙනුවෙන් කතා කළහොත් අත්අඩංගුවට ගන්නා බවට තර්ජනය කරන ආකාරය පිලිබඳ කැපී පෙනෙන උදාහරණයකි." සහිබා ජිල්, GLJ-ILRF හි මාණ්ඩලික නීතිඥ. "රජයන් සහ සමාගම් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම සඳහා වෘත්තීය සමිති සහ කම්කරුවන්ට හිරිහැර කිරීම අමානුෂික සහ නීති විරෝධී ය."

ඇඟලුම් අංශයේ වෘත්තීය සමිතින්ට සහ සේවක අයිතිවාසිකම් සුරැකීමේ සංවිධාන හට ශ්‍රී ලංකා රජය සහ හමුදාව විසින් කරන ලද ප්‍රතිප්‍රහාරවලට, මහජන තර්ජන සහ පොලිස් සෝදිසි කිරීම්, වෘත්තීය සමිති නායකයින්ගේ නිවෙස් පොලිසිය විසින් සෝදිසි කිරීම් සහ ශ්‍රී ලංකා හමුදාවේ ප්‍රධානියා රූපවාහිනියෙන් වෘත්තීය සමිතිවලට තර්ජනය කිරීමද ඇතුළත් වේ.

“කොවිඩ් - 19 කාලය තුළ ඇඟලුම් සේවකයින්ගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම සහතික කරමින් වෘත්තීය සමිති පෙරමුණ ගෙන කටයුතු කළේය. එහෙත් මෙම කටයුතු වලදී සහයෝගය ලබා දෙනවාට වඩා රජයේ පාර්ශව විසින් අපට තර්ජනය කර තිබෙනවා” ඩාබිඳු සාමූහිකයේ චමිලා තුෂාරි.

කර්මාන්තශාලාව තුල කොවිඩ් ප්‍රොටෝකෝල කඩකිරීම හොඳින් දැකගැනීමට තිබුනද, බ්‍රැන්ඩික්ස් විසින් ව්‍යාප්තියට හේතු වීම හෝ එම තත්වය උග්‍ර කිරීම පිලිබඳ ක්‍රියා ප්‍රතික්ෂේප කර ඇත.

“පළිගැනීම් සහ මර්දනයන්, බ්‍රැන්ඩික්ස් ව්‍යාප්තිය සහ ඉන් පසුව කාන්තා ඇඟලුම් සේවිකාවන්ට එරෙහි සිදු වූ හිරිහැර කිරීම සම්බන්ධයෙන් වගවීමට බාධා කර ඇත. මෙම වෘත්තීය සමිතීන් හට නිහඬව සිටීමට බලපෑම් ඇත." විරන්ට ගින්ටින්ග්, Asia Floor Wage Alliance හි නියෝජ්‍ය ජාත්‍යන්තර සම්බන්ධීකාරක.

බ්‍රැන්ඩික්ස් සිය වැඩබිම් වෙත වෘත්තීය සමිතිවලට ප්‍රවේශය ප්‍රතික්ෂේප කර ඇති අතර ඔවුන්ගේ කර්මාන්තශාලාවල වෘත්තීය සමිතිකරණයක් සිදු නොවන බවට කම්කරුවන් හට පවසා ඇත.

"වෘත්තීය සමිති හට බ්‍රැන්ඩික්ස් කර්මාන්තශාලා වෙත ප්‍රවේශය ලබා දුන්නේ නම්, කොවිඩ්-19 මාර්ගෝපදේශයන් කෙරෙහි බ්‍රැන්ඩික්ස් අනුකූල වීම නිරීක්ෂණය කිරීමට හැකි වනු ඇත - සහ ඒ මගින් බ්‍රැන්ඩික්ස් ව්‍යාප්තිය කිසි විටෙක සිදු නොවන්නට ඉඩ තිබුණා." අශිලා නිරෝෂින් මාපලගම, Stand Up Workers Union.

“බ්‍රැන්ඩික්ස් ව්‍යාප්තියෙන් පසු ඇඟලුම් සේවිකාවන් ඒ පිළිබඳව කතා කළ විට, වගකිව යුත්තන්ට වගකීම පැවරිය හැකි වන පරිදි අපි ඔවුන්ගේ හඬ තවත් ශක්තිමත් කිරීමට කටයුතු කරා. භාෂණයේ සහ සංගමයේ නිදහස සඳහා ඇති අපගේ අයිතිවාසිකම්වලට ගරු කළ යුතුයි." චන්ද්‍රා දේවනාරායන, මානව විමුක්තිය උදෙසා සංවර්ධනය (Revolutionary Existence for Human Development - RED).

"සංගමයේ නිදහස මූලික අයිතිවාසිකමක් වන අතර ශ්‍රී ලංකාව එම අයිතිය ආරක්ෂා කරන බවටත් බ්‍රැන්ඩික්ස් එයට ගරු කරන බවටත් සහතික කිරීමට ශ්‍රී ලංකා වෘත්තීය සමිති සහ ගෝලීය සහචරයින් සමඟ එක්ව කටයුතු කරනවා." GLJ-ILRF හි විධායක අධ්‍යක්ෂ ජෙනිෆර් (JJ) රෝසන්බෝම්

GLJ-ILRF සහ AFWA ශ්‍රී ලංකා රජයෙන් සහ බ්‍රැන්ඩික්ස් වෙතින් ඉල්ලා සිටින්නේ සංගමයේ නිදහසට ගරු කරන ලෙසත් කාන්තාවන් ප්‍රමුඛ වෘත්තීය සමිති සමඟ සංවාදයේ නිරත වන ලෙසත්ය.

ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තය එහි අපනයනවලින් 40% ක් නියෝජනය කරන අතර, එය රටට ඉතා වැදගත් විදේශ මුදල් ප්‍රභවයකි. වර්තමානයේ විදේශ මුදල් හිඟය හේතුවෙන් නිදහසින් පසු ශ්‍රී ලංකාව, ඉතිහාසයේ ඇති වූ දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණ දී ඇත.

###

සම්බන්ධ වීමට:

Rachel Cohen, racohen78@gmail.com

Sahiba Gill, sahibagill@globallaborjustice.org

Tasmin, tasmin.k@asia.floorwage.org

**Global Labor Justice – International Labor Rights Forum (GLJ – ILRF)** යනු වැදගත් ලෙස රැකියාවේ නියැලීමට ඇති අයිතිය ආරක්ෂා කරන ප්‍රතිපත්ති සහ නීති ඉදිරියට ගෙන යාමට; සංගමයේ නිදහස සහ ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට කම්කරුවන්ට ඇති හැකියාව ශක්තිමත් කිරීමට; සහ සැපයුම් දාමයේ කම්කරු අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සමාගම් වගවීම වෙනුවෙන් ජාත්‍යන්තර වශයෙන් ක්‍රියා කරන රාජ්‍ය නොවන සංවිධානයකි.

**Asia Floor Wage Alliance (AFWA)** ආයතනය යනු ඇඟලුම් නිෂ්පාදන රටවල් හි (බංග්ලාදේශය, කාම්බෝජය, ඉන්දියාව, ඉන්දුනීසියාව, පකිස්ථානය, ශ්‍රී ලංකාව) සහ පාරිභෝගික කලාපයන් (ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපය) හරහා ගෝලීය ඇඟලුම් නිෂ්පාදන ජාලයන් තුල ක්‍රියාත්මක වන දරිද්‍රතා මට්ටමේ වැටුප්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ සංගමයේ නිදහසට අදාළ විසඳුම් සෙවීමට ක්‍රියාත්මක වන ආසියානු කම්කරුවන් මූලික කරගත් ගෝලීය කම්කරු සහ සමාජ සන්ධානයක්.